# පර්යේෂණමය විස්තෘත සාරාංශ පත්‍රිකා කැඳවීම

## පුරාවිද්‍යාව පිළිබඳ ශිෂ්‍ය විද්‍යාර්ථීන්ගේ අටවැනි පර්යේෂණ සමුළුව - 2023

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

**(විස්තෘත සාරාංශ පත්‍රිකා සකස් කිරීම පිළිබඳ පොදු නියමයන්)**

### 01. මාතෘකාව (Topic)

- සිංහලෙන් නම් FMAbhaya අක්ෂරයෙන් 14 ප්‍රමාණයෙනි. Bold කළ යුතුය.
- ඉංග්‍රීසියෙන් සකස් කරන්නේ නම් Times New Roman අක්ෂරයෙන් 13 ප්‍රමාණයෙනි.

### 02. කර්තෘ නාමය.

- සිංහලෙන් නම් FMAbaya අක්ෂරයෙන් 10 ප්‍රමාණයෙනි.
- ඉංග්‍රීසියෙන් නම් Times New Roman අක්ෂරයෙන් 10 ප්‍රමාණයෙනි.
- කර්තෘ නාමය දැක්වීමේ දී මාතෘකාවට පහළින් පහත පරිදි යොදන්න.
- සෑම අවස්ථාවකදීම ශිෂ්‍ය විද්‍යාර්ථයා ප්‍රථම කතුවරයා වේ.
- එක් කර්තෘ වරයෙක් පමණක් නම් - විමලරත්න ඒ.එච්
- කර්තෘවරුන් කිහිප දෙනෙක් නම් - රණසිංහ ර්.එම්.එන්, විමලරත්න ඒ.එච්, මධුසංක ජී.එච්
- විෂයානුබද්ධ උපදේශක ආචාර්යවරයා සම කතෘත්වය දරයි නම්, එම ආචාර්යවරයා සම කතෘත්වය දරයි. සෙසු කර්තෘවරුන් පිළිබඳ සඳහන් කළ යුතුය.

### 03. පාදක සටහන් යොදන විට.

විමලරත්න ඒ.එච්

සිව්වැනි වසර, පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

wimalarathna123@gmail.com

## 04. හැඳින්වීම (Introduction)

පර්යේෂණය පිළිබඳ ඉතා පැහැදිලි හා සංක්ෂිප්ත හැඳින්වීමක් සිදුකිරීම බලාපොරොත්තු වේ. පර්යේෂණයට අදාළ අරමුණු, පර්යේෂණ ගැටළුව, ආදිය පිළිබඳව පැහැදිලි කරන්නේ ද හැඳින්වීම තුළ දී ය.

## 05. ක්‍රමවේදය (Methodology)

පර්යේෂණය සිදු කිරීමේ ක්‍රමවේදය මෙහිදී විස්තර කළ යුතුය. පර්යේෂණ අරමුණු සහ පර්යේෂණ ගැටලුවට අනුව දත්ත එක් රැස් කර ගැනීමේ සහ දත්ත විශ්ලේෂණය කිරීමේ උපක්‍රම පිළිබඳවත්, සමස්ත පර්යේෂණය දියත් කළ ආකාරය පිළිබඳවත්, පර්යේෂණ සීමා පිළිබඳවත් අවධානය යොමු කරමින් මෙම ක්‍රමවේදය සකස් කළ යුතු වේ.

## 06. ප්‍රතිඵල සහ සාකච්ඡාව (Results and Discussion)

පර්යේෂණය සිදු කිරීම මඟින් සොයාගත් ප්‍රතිඵල විශ්ලේෂණය සිදු කිරීම තුළින් සාකච්ඡාව ගොඩනගන්නේ මෙහිදී ය. පර්යේෂණයට අදාළ ප්‍රතිඵල පැහැදිලි කිරීම මෙන්ම සෘජු ලෙස කරුණු ඉදිරිපත් කළ හැකිය. පූර්ව පර්යේෂණ හා සමගාමී පර්යේෂණ සමඟ ස්වකීය පර්යේෂණමය ප්‍රතිඵල ඇගැයීම සිදු කළ හැකිය. සමාජීය වශයෙන් හා කාලීන වශයෙන් පර්යේෂණයේ ප්‍රතිඵල වැදගත් වන ආකාරය හා අවසන් නිගමනය විස්තර කළ යුතුය.

## 07. ප්‍රමුඛ පද (Key Words)

අවමය වචන තුනක් සහ උපරිම වචන පහක් ඉදිරිපත් කරන්න.

## 08. ආශ්‍රිත ග්‍රන්ථ (References)

Harward ක්‍රමයට විය යුතුය. පර්යේෂණයේ දී ඉතාම වැදගත් වූ මූලාශ්‍ර තුනක් පමණක් සඳහන් කරන්න.

## 09. පොදු කරුණු

- අන්තර්ගතය FMAbaya යොදන විට අක්ෂර වල ප්‍රමාණය (Font Size) 12 විය යුතුය.
- Times New Roman යොදන විට අක්ෂර ප්‍රමාණය (Font Size) 11 විය යුතුය.
- විද්‍යුත් තැපැල් ලිපිනය - ursaru@ssh.rjt.ac.lk
- පේළි අතර පරතරය (Line Space) 1.25 විය යුතුය.
- Page Size B5
- සමස්ථ පර්යේෂණ පත්‍රිකාවේ සංක්ෂිප්තයේ වචන ප්‍රමාණය 750 - 800 අතර විය යුතුය.

**සැ.යු.**

- ආචාර්යවරයෙකුගේ නිර්දේශය මත යොමු කරන්නේ නම් ඔබගේ පර්යේෂණ පත්‍රිකාව සමුළුව සඳහා තෝරාගැනීමේ වැඩි ඉඩක් පවතී.

- ආචාර්යවරයෙකුගේ නිර්දේශය මත එවන්නේ නම් ලබා දී ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කොට පත්‍රිකාව (Abstract) සමඟ එවිය යුතුය.
- කර්තෘගේ හෝ කර්තෘන්ගේ සම්පූර්ණ විස්තර එවා ඇති අයදුම්පතෙහි ආකාරයට එවිය යුතුය.
- යොදා ගන්නා තේමාව පිළිබඳව සඳහන් කළ යුතු වේ.